රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2019

මගේ අංකය : VI/වි.ශ්‍රේ.උ./Cir/TS
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.05.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථාව අනුව භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට ජ්‍යෙෂ්ඨතාවය මත උසස් කිරීම</u>**

1994 ජුලි 26 දිනැති අංක 829/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශේෂ පන්තියට උසස්වීම් ලැබීමට පහත පරිදි සුදුසුකම් ලබන භාෂා පරිවර්තක සේවයේ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 2007.08.24 දිනැති හා අංක 06/2006(IV) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 6-2006 (පියවර 23) වැටුප් ඛණ්ඩය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු.25,345 – 450 x 15 – 31,545 ක් වේ.

03. ඇගයීමේ ක්‍රමවේදය :-

විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩුවලින් 40%ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් ජ්‍යෙෂ්ඨතාවය මත සිදු කරනු ලබයි. මේ සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙළ අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ.

| | | මුළු ලකුණු |
|---|---|---|
| I. | ජ්‍යෙෂ්ඨත්වය | 60 |
| II. | පළපුරුද්ද | 40 |
| | | 100 |

**I. ජ්‍යෙෂ්ඨත්වය :-**

ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු දෙනු ලබන්නේ නිලධරයෙකු භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ වසර 8ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව එළඹෙන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එක් වසරක් සඳහා ලකුණු 06 බැගින් ලකුණු 60ක උපරිමයක් දක්වා පමණි. මෙහිදී මාස 06කට වැඩි වර්ෂයකට අඩු සේවා කාලයක් සඳහා ලකුණු 03ක් ලැබෙන අතර, හය මාසයකට අඩු කාලයක් සඳහා ලකුණු දෙනු නොලැබේ.

II. **පළපුරුද්ද :-**

භාෂා පරිවර්තක සේවය විශේෂ පන්තියේ වැඩබලන නිලධරයකු ලෙස සතුටුදායක එක් වසරක් සඳහා ලකුණු 04 බැගින් ලකුණු 40ක උපරිමයක් දක්වා පළපුරුද්ද සඳහා ලකුණු දෙනු ලැබේ.

04. විශේෂ පන්තියට උසස් කිරීම සඳහා සුදුසුකම්

I. තනතුරේ ස්ථිර කර තිබීම.

II. භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ වසර 8ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා වැටුප් වර්ධක 8ක් උපයාගෙන තිබීම.

III. නියමිත කාල පරිච්ඡේදය තුළ අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

IV. නියමිත කාල පරිච්ඡේදය තුළ දෙවන භාෂා ප්‍රවීනතාවය ලබා තිබීම.

05. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල භාෂා පරිවර්තක සේවයට අයත් විශේෂ පන්තියට උසස්වීමට සුදුසුකම් ලබන සියළුම නිලධරයන් මේ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් අයදුම්පතෙහි දක්වා ඇති විස්තර නිවැරදි බවට සහතික කර අයදුම්කරුගේ උප්පැන්න සහතිකය, පත්වීම් ලිපිය, ස්ථිර කිරීමේ ලිපිය, I පන්තියට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය, අධ්‍යාපන සහතික සහ සුදුසුකම් සනාථ කරන අනෙකුත් සහතිකවල සහතික කළ පිටපත් ද සමඟ තම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2019.06.26 වේ.

07. කරුණාකර මෙහි සඳහන් කරුණු අදාළ නිලධරයන්ට දැනගැනීමට සලස්වන්න.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

ආදර්ශ අයදුම්පත්‍රය

**1994 ජූලි 26 දිනැති අංක 829/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශේෂ පන්තියට උසස් කිරීමේ අයදුම්පත්‍රය**

01. සේවා ස්ථානය

i. අමාත්‍යාංශය :- ........................................................................................

ii. දෙපාර්තමේන්තුව :- ........................................................................................

iii. උප කාර්යාලය :- ........................................................................................

02. පත්වීම් ලිපියේ දැක්වෙන පරිදි නිලධාරියාගේ/ නිලධාරිනියගේ නම :- ................................
.................................................................................................... මයා/ මිය/ මෙනවිය.

03. නම වෙනස් කර ඇත්නම් සංශෝධිත නම :- ........................................................................
..................................................................................................................................

04. උපන් දිනය :- ........................................................

05. ස්ථිර පෞද්ගලික ලිපිනය :-
..................................................................................................................................
..................................................................................................................................

06. භාෂා පරිවර්තක සේවයට මුලින් පත්වූ දිනය :- ......................................................................

07. i පත්වීම් ලිපියේ අංකය :- ........................................

ii පත්වීම් දිනය :- ........................................

08. ඔබ සේවය ස්ථිර කර තිබේද? :- ඔව්/නැත

09. අධ්‍යාපන සුදුසුකම් :-

i ..........................................................................................................................
..............................................................................................................................

ii .........................................................................................................................
..............................................................................................................................

iii ........................................................................................................................
..............................................................................................................................

iv ........................................................................................................................
..............................................................................................................................

v .........................................................................................................................
..............................................................................................................................

10. භාෂා පරිවර්තක සේවයේ I පන්තියේ වසර 8ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :- ..........................................

11. වැඩබලන නිලධාරියෙකු ලෙස සේවය කර ඇත්නම් පත්වීම් දිනය :- ............................................

12. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ දිනය :- .....................................................

13. අදාල භාෂා ප්‍රවීනතාවය සමත් වූ දිනය :- ........................................

14. ..........................................................................................................................................
අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ භාෂා පරිවර්තක සේවයේ .................................
(පන්තිය) වශයෙන් සේවය කරන ..........................................................................................
........................................................ (සම්පූර්ණ නම) වන මා විසින් සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් 1994 ජූලි 26 දිනැති අංක 829/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශේෂ පන්තියට උසස් වීමට සුදුසුකම් ලබන බවත් ප්‍රකාශ කරමි.

දිනය :- .................................        ...............................................
නිලධාරියාගේ අත්සන

<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

.........................................................................................................................................
අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ............. පන්තියේ භාෂා පරිවර්තක තනතුරක් දරණ ............................................................................................................. මයා/ මිය/ මෙනවිය විශේෂ පන්තියට උසස් වීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයේ 1 සිට 12 දක්වා වූ තොරතුරු ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා/ නිලධාරිනිය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමි.

I. සේවා කාලය තුළ ලබාගෙන ඇති අඩ වැටුප්/වැටුප් රහිත නිවාඩු විස්තර :-
.........................................................................................................................
.........................................................................................................................

II. උසස්වීම ඉල්ලනු ලබන දිනට නිලධාරියාගේ/ නිලධාරිනියගේ භාෂා පරිවර්තක නිලධාරියෙකු වශයෙන් සේවය කරන ලද සම්පූර්ණ සේවා කාලය :- ..........................................................

III. වසර 08 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන, සතුටුදායක හා සක්‍රීය සේවා කාලයක් තිබේද යන වග :-
.........................................................................................................................

IV. නිලධාරියාට/ නිලධාරිනියට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද? (තිබේ නම් විස්තර සඳහන් කරන්න)

.......................................................................................................................................

.......................................................................................................................................

V. වැඩ බැලීමේ කාලය

| සේවා ස්ථානය | දින වකවානුව | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

VI. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :-

.................................................. දින සිට මෙම නිලධාරියා/ නිලධාරිනිය විශේෂ පන්තියට උසස් කිරීම නිර්දේශ කරමි./ නොකරමි.

දිනය :- ............................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :- .............................

නම :- .........................................................................

තනතුර :- .........................................................................

නිල මුද්‍රාව

<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් සඳහන් කර ඇති නිර්දේශය මවිසින්ද නිර්දේශ කරමි.

දිනය :- ...........................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :- ......................................

නිල මුද්‍රාව